# පුරප්පාඩු දැන්වීමයි
# මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින විෂයානුබද්ධ විශේෂඥ තනතුරට පත් කිරීම සඳහා දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I වන ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** <u>**අවශ්‍ය සුදුසුකම්**</u>

i. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම.
ii. දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.
iii. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා 01/2020(I) හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**02. බඳවා ගැනීමේ ක්‍රමය**

මෙම නිවේදනයේ දක්වා තිබෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත, ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ.
(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

**සටහන:** සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**03. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය) **" ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර "** යන ලිපිනයට **2025.08.01** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.
- නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.

(ආදර්ශ අයදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

**04.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සළසා නොමැති සියළුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

**05.** මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
සුජානි ආර්. විජේතුංග,
ලේකම් (වැ.බ.),
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 ජූලි මස 04 වැනි දින
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලයේදීය